# වාර්ෂික වාර්තාව
## வருடாந்த அறிக்கை
## ANNUAL REPORT

# 2012

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

இலங்கை சனநாயக சோசலிசக் குடியரசின்
அரசாங்க சேவை ஆணைக்குழு

PUBLIC SERVICE COMMISSION
OF
THE DEMOCRATIC SOCIALIST REPUBLIC
OF SRI LANKA





## රාජ්‍ය සේවා කොමිෂන් සභාව
## වාර්ෂික වාර්තාව
## 2012

177 , නාවල පාර
නාරාහේන්පිට
කොළඹ 05

දුරකථන - 0112-136600 / 0112-136650 / 0112-136700
ෆැක්ස් - 0112-369302 / 0112-369305
ඊ මේල් - secretary@psc.gov.lk
වෙබ් - www.psc.gov.lk

මගේ අංකය: PSC/ADM/06/02/05/2012
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
177, නාවල පාර
නාරාහේන්පිට
කොළඹ 05

2013 අගෝස්තු මස 26 දින.

මහ ලේකම්
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

මහත්මයාණෙනි

<u>2012 ජනවාරි 01 දින සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව 2012 ජනවාරි 01 දින සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව මේ සමඟ ඔබ වෙත එවමි.

මෙයට - විශ්වාසී

ටී.එම්.එල්.සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව





## දැක්ම

සමානාත්මතා ගුණය පෙරදැරිව, යුක්ති සහගතව, විනිවිදභාවයෙන් යුක්තව හා තිරසාරව මහජනතාවට සේවය කරන්නාවූ ද, දූෂිතභාවය, දේශපාලනීකරණය, නාස්තිය, අනවධානය හා අලසභාවය වැනි සියළු නිෂේධ බලපෑම්වලින් තොරව ප්‍රජාතන්ත්‍රවාදී පාලනය කෙරෙහි සාධනීය අයුරින් සහයවන්නාවූ ද, කාර්යක්ෂම, විනයගරුක හා තෘප්තිමත් රාජ්‍ය සේවයක් ප්‍රවර්ධනය කිරීම සහ එයට සහය වීම.

## මෙහෙවර

කොමිෂන් සභාවේ මෙහෙවර වනුයේ, ජනතා සේවයට කැපවූ පරිනත, කාර්යක්ෂම, අපක්ෂපාතී හා අතිශයින් අභිප්‍රේරිත රාජ්‍ය නිලධාරී මඩුල්ලක් ස්ථාපනය කර පවත්වාගෙන යනු ලැබීමය.

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්

## සභාපති

විද්‍යාජෝති වෛද්‍ය දයාසිරි ප්‍රනාන්දු මහතා

## සාමාජිකයන්

ජනාධිපති නීතිඥ පාලිත එම්. කුමාරසිංහ මහතා

සිරිමාවෝ ඒ. විජේරත්න මහත්මිය

එස්.සී. මාන්නප්පෙරුම මහතා

ආනන්ද සෙනවිරත්න මහතා

එන්.එච්. පතිරණ මහතා

එස්. තිල්ලෙයිනඩරාජා මහතා

එම්.ඩී.ඩබ්ලිව්. ආරියවංශ මහතා

ඒ. මොහොමඩ් නහියා මහතා






| අනු අංකය | | කාරණය | පිටු අංකය |
|---|---|---|---|
| 1 | | හැඳින්වීම | 01 |
| 2 | | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග | 01 |
| 3 | | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල | 02 |
| | 3.1 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කළ හැකි අවස්ථා | 03 |
| 4 | | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය | 03 |
| 5 | | සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් ඉටු කරන ලද කටයුතු පිළිබඳ විස්තර | 05 |
| | 5.1 | **ආයතන අංශය** | 05 |
| | 5.1.1 | ආයතන අංශයේ කාර්යභාරය | 06 |
| | 5.1.2 | ආයතන අංශයේ ප්‍රගති සමාලෝචනය | 06 |
| | 5.2 | **පත්කිරීම් හා උසස් කිරීම් අංශය** | 11 |
| | 5.2.1 | පත්කිරීම් හා උසස් කිරීම් අංශයේ කාර්යභාරය | 11 |
| | 5.2.2 | පත්කිරීම් හා උසස්කිරීම් අංශයේ ප්‍රගති සමාලෝචනය | 12 |
| | 5.3 | **විනය අංශය** | 22 |
| | 5.3.1 | විනය අංශයේ කාර්යභාරය | 23 |
| | 5.3.2 | විනය අංශයේ ප්‍රගති සමාලෝචනය | 24 |
| | 5.4 | **අභියාචනා අංශය** | 25 |
| | 5.4.1 | අභියාචනා අංශයේ කාර්යභාරය | 26 |
| | 5.4.2 | අභියාචනා අංශයේ ප්‍රගති සමාලෝචනය | 26 |
| | 5.5 | **පාලන අංශය** | 27 |
| | 5.6 | **මූල්‍ය අංශය** | 28 |
| 6 | | මුදල් ප්‍රතිපාදනය | 28 |
| 7 | | කාර්ය මණ්ඩලය | 29 |
| | 7.1 | සංවිධාන සටහන (ඇමුණුම 03) | 36 |
| | 7.2 | කාර්ය මණ්ඩලය | 29 |
| | 7.3 | කාර්ය මණ්ඩල පුහුණු කටයුතු | 29 |
| 8 | | 2012 වර්ෂය තුළ එක් එක් අංශ විසින් කරුණු ඉදිරිපත් කර ඇති නඩු ගණන | 30 |
| 9 | | කොමිෂන් සභා රැස්වීම් | 30 |
| 10 | | ස්තුතිය | 30 |
| 11 | | ඇමුණුම් | 32-36 |

## හැඳින්වීම

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවකගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. 2011.05.13 දින සිට මෙම කොමිෂන් සභාව පත් කරනු ලැබ ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(5) ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2012 ජනවාරි 01 වන දින සිට 2012 දෙසැම්බර් 31 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරයි.

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග

ශ්‍රී ලංකාව, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක්ව පැවති සමයේ දී, වර්ෂ 1946 මැයි මස 15 දිනැති ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාව මගින් ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී. එමගින්, රාජ්‍ය නිලධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරුකිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම් පිළිබඳ විධායක බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා දෙන ලදී.

වර්ෂ 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමග, එතෙක් වසර විසි හයක් පුරා ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි වූ අතර රාජ්‍ය සේවය පිළිබඳ අධිකාරි බලය අමාත්‍ය මණ්ඩලය වෙත පවරා දෙනු ලැබිණ.

වර්ෂ 1978 දී දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රතිෂ්ඨාපනය කරන ලද අතර, එම කොමිෂන් සභාව අභියාචනා බලධාරියා වශයෙන් පමණක් කටයුතු කරන ලදී. 1992 වර්ෂයේදී රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරීන්ගේ (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ගේ සිට ඉහළ තනතුරු හැර) පත් කිරීම් , උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම පිළිබඳ විධායක බලතල අමාත්‍ය මණ්ඩලය විසින් පවරන ලද අභිනියෝජිත බලය ප්‍රකාරව මෙම කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලදී. කොමිෂන් සභාව හෝ එමගින් බලය අභිනියෝජිත කමිටුවක් විසින් ගනු ලබන තීරණ වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ අවලංගු කිරීමට ඉඩ සැලසෙන බලතල අමාත්‍ය මණ්ඩලය වෙත රඳවා ගනු ලැබිණ.

වර්ෂ 2001 දී, 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, රාජ්‍ය සේවය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එතෙක් පැවති IX වන පරිච්ඡේදය පරිච්ඡින්න කොට නව පරිච්ඡේදයක් ඇතුලත් කරන ලදී. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවකගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වූ අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබුණි. මෙම සංශෝධනය මගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තත්වය





ප්‍රබල වෙනසකට භාජනය වූ අතර, ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, රාජ්‍ය සේවයේ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථාන මාරු කිරීම හා විනය පාලනය කිරීම පිලිබඳ අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී තිබුණු බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරිණි. තවද මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට වගකීමට හා පිළිතුරු දීමට බැඳී සිටින ආයතනයක් බවට පත්කෙරිණි.

වර්ෂ 2010 දී , 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ස්ථාපනය හා කර්තව්‍යයන්ට අදාළ කරුණු සංශෝධනය කරනු ලැබ ඇත. මෙය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට පිළිතුරු දිය යුතු කොමිෂන් සභාවකි. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. ඔවුහු තෙවසරක කාල පරිච්ඡේදයක් සඳහා ස්වකීය ධුර හොබවන අතර, තවදුරටත් එවැනි එක් කාල පරිච්ඡේදයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සන් වනු ඇත.

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 55(1) අනු ව්‍යවස්ථාව අනුව අමාත්‍ය මණ්ඩලය විසින් රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, පොලිස් නිලධාරීන් ද ඇතුළු ව රාජ්‍ය නිලධාරීන් පත්කිරීම, උසස්කිරීම, ස්ථාන මාරුකිරීම හා ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම පිළිබඳ බලතල කොමිෂන් සභාව වෙත පවරා ඇත.

## 03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල

18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පැවරී ඇති බලතල අනුව යුධ හමුදා, නාවික හමුදා හා ගුවන් හමුදා සාමාජිකයන් හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවලින් පත්කරන ලද පළාත් රාජ්‍ය සේවකයින්, ජනාධිපතිවරයා විසින් පත්කරන ලද අමාත්‍යාංශ ලේකම් හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද උපලේඛන ගත නිලධාරීන් සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල ආයතන සේවකයන්ද හැර පළාත් සභාවල සේවය කරන දීප ව්‍යාප්ත සේවා වලට ගැනෙන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් ,

- පත්කිරීම
- උසස් කිරීම
- ස්ථාන මාරු කිරීම
- විනය පාලනය හා සේවයෙන් පහ කිරීම , රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි.

## 3.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කළ හැකි අවස්ථා

පහත සඳහන් අවස්ථාවන්හි දී හැරුණ විට කොමිෂන් සභාවේ තීරණ කිසිදු අධිකරණයකදී හෝ විනිශ්චය සභාවකදී මත විමසුමකට ලක්කළ නොහැකිය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 අ ව්‍යවස්ථාව අනුව 126 ව්‍යවස්ථාවේ (1) වන, (2) වන, (3) වන, (4) වන හා (5) වන ඡේදයන්හි විධිවිධානයන්ට යටත්ව, මූලික අයිතිවාසිකම් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැමිණිලි කිරීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 (1) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව හා 2002 අංක 4 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය පනතින් ස්ථාපනය කරන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනය කිරීම.

## 04. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය

2012 ජනවාරි මස 01 දින සිට 2012 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමස්ත ශ්‍රී ලාංකික ජාතියේ උන්නතියත්, මාතෘ භූමියේ සංවර්ධනයත් උදෙසා ගෞරවනීය රාජ්‍ය සේවයක් ඇතිකරලීමට හා පවත්වා ගෙන යාමේ තිර අදිටනින් විනිවිදභාවය හා අවංකභාවය පෙරදැරි කර ගෙන තම කටයුතු කරගෙන යන ලදී.

එහිදී නොයෙකුත් වෘත්තීන් හා සේවාවන් සඳහා බඳවාගැනීම් පරිපාටි හා සේවා ව්‍යවස්ථාවන් ගැඹුරින් අධ්‍යයනය කරමින් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය හා කාර්යසාධනය වැඩි වර්ධනය වන පරිදි සංශෝධනයන්ට ලක්කරමින්ද, නව විධිවිධාන පනවමින්ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. ගැටළුකාරී තත්වයන් පැනනැගුණු සෑම අවස්ථාවකදීම අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට කැඳවා සභාපති ප්‍රමුඛ කොමිෂන් සභාවේ සාමාජිකයන්ද ,රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ඇතුළු ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ද සමග සාකච්ඡා වට පවත්වා සාමූහික එකගතාවයකට පැමිණෙමින් කඩිනමින් කටයුතු අවසන් කිරීමට කටයුතු කරන ලදී.

රාජ්‍ය සේවයේ උසස් මට්ටමේ තනතුරුවලට පත්කිරීමේදී හා උසස් කිරීමේදී අධ්‍යාපනික හා වෘත්තීය මෙන්ම පලපුරුද්ද සම්බන්ධයෙන්ද නිසි අවධානය යොමු කරන ලදී. එමගින් විනිවිද භාවයෙන් යුක්තව යුක්තිය හා සාධාරණය ඉටු වන පරිදි කටයුතු කිරීමට හැකි විය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට කැඳවා සාමූහික එකඟතාවයකට පැමිණීමෙන් අමාත්‍යාංශයට අදාළ සේවා ව්‍යවස්ථා හා උසස්වීම් . බඳවාගැනීම් ඇතුළු කාරණා රාශියකට විසඳුම් ලබා දී ඇත.

විදුහල්පති පුරප්පාඩු පැවති ජාතික පාසැල්වල විදුහල්පතිවරුන් පත් කිරීමේ දී , ඒ වන විට වැඩ ආවරණය කළ විදුහල්පතිවරුන් හා වෙනත් බාහිර පාර්ශව වෙතින් විවිධ බධා කිරීම් සිදුවීමෙන් පාසැල් කිහිපයක මතු වූ ගැටළු විශ්ලේෂණය කර . සුදුසුකම් ලැබූ නව විදුහල්පතිවරුන්ට යුක්තිය හා සාධාරණය ඉටු කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව ඇතුළු වෙනත් රාජ්‍ය ආයතනවල සහයෝගය ලබා ගනිමින් ද, අවශ්‍ය අවස්ථාවල විනයානුකූලව





කටයුතු කරමින් ද , අගතියට පත්වූ පාර්ශව වෙතොත් ඔවුන්ගේ ගැටළු නිරාකරණය කරමින් ද . රාජ්‍ය සේවයේ ගෞරවය ආරක්ෂා කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කරන ලදී.

රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් බලාපොරොත්තු වූ අපේක්ෂිත චර්යාධර්ම කඩකළ නිලධාරීන්ට විරුද්ධව කටයුතු කිරීමේදී අවශ්‍ය සියලු තොරතුරු මැනවින් හා ගැඹුරින් විමර්ශනය කිරීමෙන් අනතුරුව සංගතතාවය පවත්වා ගනිමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග ලබා දී ඇත. එසේ වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව රජයේ නිලධාරීන්ට එරෙහි ව විනය ක්‍රියාමාර්ග ගැනීමේ දී අදාළ විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් කැඳවනු ලබන නිරීක්ෂණ, නිර්දේශ සහ වාර්තා බොහෝ අවස්ථාවලදී නොඑවීම මෙන්ම, ඇතැම් අවස්ථාවලදී අසම්පූර්ණ තොරතුරු වාර්තා කිරීම හේතුවෙන් එක් එක් නිලධාරීන් හා අදාළ විනය කරුණු පිළිබඳව තීරණ ගැනීම ප්‍රමාද කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට සිදු වේ. එහි අවසාන ප්‍රතිඵලය වන්නේ කොමිෂන් සභාව විසින් ලබා දිය යුතු වන අවසාන තීරණය ප්‍රමාද වීමයි. (උදාහරණය:- විනය කරුණු මත ස්ථාන මාරු කිරීමට හෝ වැඩ තහනම් කිරීමට නිර්දේශ ඉදිරිපත් කරන නමුත් ඊට පදනම් වන කරුණු කිසිවක් පැහැදිලි නොකිරීම හා මූලික විමර්ශන වාර්තා නොඑවීම. මූලික විමර්ශන වාර්තා එවුව ද සටහන් කරගත් ප්‍රකාශ හා/හෝ අත්අඩංගුවට ගත් ලේඛණ /භාණ්ඩ ඉදිරිපත් නොකිරීම)

කොමිෂන් සභාව වෙත ලැබෙන අසම්පූර්ණ වාර්තා විශේෂයෙන් මූලික විමර්ශණ වාර්තා පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන කාරණය වන්නේ රජයේ විනය ක්‍රියාමාර්ග හා විනය කාර්ය කළමනාකරණය පිළිබඳව වන අවම දැනුම හා ඒ හේතුවෙන් සිදුවන අඩු පාඩු රැසක් ඇති බවයි. රජයේ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ විසින් විනය කාර්ය කළමනාකරණය පිළිබඳව එම විෂය සම්බන්ධයෙන් වගකීම් දරන නිලධාරී පිරිස පමණක්වත් වාර්ෂිකව විධිමත් පුහුණුවකට යොමු කරන්නේ නම් එම අඩු පාඩු මගහරවා ගැනීමටත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රමාද අවම කර ගැනීමටත් ඉඩ ප්‍රස්ථාව උදා වනු ඇත. අමාත්‍යංශ වල අතිරේක ලේකම්වරුන් ගෙන්වා පවත්වනු ලැබූ වාර්ෂික රැස්වීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව එම කරුණ පිළිබඳව අවධාරණය කර ඇත.

නොයෙකුත් තත්වයන් යටතේ තමන්ට අගතියක් වූ බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා කළ රජයේ නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන්ද කටයුතු කිරීමේදී අදාළ විස්තර මැනවින් විශ්ලේෂණය කොට යුක්තිය හා සාධාරණය ඉටුවන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග ලබා දීමට කටයුතු කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගෙන්වා සාකච්ඡා කිරීමට අමතරව රාජ්‍ය සේවා කොමිෂන් සභා උපදෙස් හා චක්‍රලේඛ මෙන්ම මෙම කාර්යාල කටයුතු වලට සම්බන්ධ ගැසට් නිවේදනද නිකුත් කර ඇත. ඊට අමතරව මාර්ගෝපදේශ හා ආකෘතිපත්‍ර සෑම දෙනාගේම දැනගැනීම හා පහසුවෙන් ප්‍රයෝජනයට ගැනීමට හැකිවන අයුරින් වෙබ් අඩවියට ඇතුළත් කර ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලැබෙන නිර්දේශ හා ලිපි ලේඛණ වල පවතින නොයෙකුත් අඩුපාඩු කම් නිසා ඒ සම්බන්ධව ක්‍රියා කිරීම හා තීරණ ගැනීම ප්‍රමාද වන බැවින් අමාත්‍යංශ වල අතිරේක ලේකම්වරුන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට කැඳවා කොමිෂන් සභාවේ සෑම අංශයකම නිලධාරීන් ඔවුනොවුන් වෙත හඳුන්වා දෙමින් ඒ ඒ විෂයන් සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ පහදා දීමක්ද එක් දින වැඩමුළුවක අනුසාරයෙන් සිදු කරන ලදී.

## 05. සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් ඉටු කරන ලද කටයුතු පිළිබඳ විස්තර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් අංශයන් ස්ථාපිත කොට අවශ්‍ය දායකත්වය ලබා ගෙන ඇත.

- ආයතන අංශය
- පත්කිරීම් හා උසස්කිරීම් අංශය
- විනය අංශය
- අභියාචනා අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය

### 5.1 ආයතන අංශය

ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ආ ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයෙන් විධිවිධාන සලසනු ලබන තෙක්, ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනයේ දී රාජ්‍ය සේවයට අදාළව බලාත්මකව පැවති සියලු රීති, නියෝග හා කාර්ය පටිපාටි, එම පරිච්ඡේදය යටතේ රාජ්‍ය සේවයට සම්බන්ධව සාදනු ලැබූ හෝ විධිවිධාන සලස්වනු ලැබූ රීති, නියෝග හා කාර්ය පටිපාටි අවශ්‍ය වෙනස් කිරීම් සහිතව බලාත්මකව පවතින ලෙස සැලකිය යුතු බව සඳහන් වී ඇත.
ඒ අනුව රාජ්‍ය සේවයට අදාළ රීති, නියෝග හා කාර්ය පටිපාටි පිළිබඳ විධිවිධාන සැලැස්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙහි ආයතන අංශය විසින් ඉටු කරනු ලැබේ.

ආයතන අංශය සඳහා අනුමත තනතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| අතිරේක ලේකම් | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 |
| සහකාර ලේකම් | 04 |
| කළමනාකරණ සහකාර | 05 |





### 5.1.1 ආයතන අංශයෙහි කාර්යභාරය


- රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයට අයත් බලය, වගකීම් සහ බලතල පැවරීමට අදාළ කටයුතු.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සම්පාදනය, සංශෝධනය හා ප්‍රසිද්ධ කිරීම.
- රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති පදනම් කරගත් උපදෙස් මාලා සකස් කිරීම සහ ඒ සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.
- චක්‍රලේඛ, නියෝග හා උපදෙස් නිකුත් කිරීම.
- රාජ්‍ය සේවයට අදාළ සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම සහ සංශෝධනය කිරීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි, චක්‍රලේඛ සහ නියෝගවලින් බැහැර වන අවස්ථාවලදී ඒ පිළිබඳ කටයුතු කිරීම.
- කාර්ය පටිපාටික රීති වලට ආවරණය නොවන කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
- රාජ්‍ය සේවයට අදාළ කාර්ය පටිපාටික රීති වලට අනුව දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම. යථාවත් කිරීම, පවත්වා ගෙන යාම සහ තොරතුරු බෙදා හැරීම.
- රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරු පටිපාටි සකස් කිරීම හා සංශෝධනය කිරීම.

### 5.1.2 ආයතන අංශයේ ප්‍රගති සමාලෝචනය 2012 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා.

ඉහත කාල සීමාව තුළ පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇත.

| | කාරණය | එකතුව |
|---|---|---|
| 1 | නව බඳවා ගැනීම් පරිපාටි | 271 |
| 2 | නව සේවා ව්‍යවස්ථා | 07 |
| 3 | බඳවා ගැනීම් පරිපාටි සංශෝධනය | 15 |
| 4 | සේවා ව්‍යවස්ථා සංශෝධනය | 06 |
| 5 | ස්ථාන මාරු පරිපාටි | 10 |
| 6 | ශ්‍රේෂ්ඨාධිකරණය,පරි.අ.හි.විනි.අධිකාරිය,අභියාචනාධිකරණය සම්බන්ධ කරුණු | 11 |
| 7 | චක්‍රලේඛ | 03 |
| 8 | විශේෂ අවස්ථාවන්හිදී බඳවා ගැනීම් පරිපාටි හා සේවා ව්‍යවස්ථා වලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම්. | 33 |
| 9 | ප්‍රතිපත්ති සම්බන්ධ කටයුතු | 21 |
| 10 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලට අදාළ කරුණු | 17 |
| 11 | පොදු කරුණු | 80 |
| 12 | එකතුව | 474 |

වගුව අංක 01




රූප සටහන අංක 01



## 2012.01.01 -2012.12.31 දක්වා අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටි තොරතුරු

| අනු අංකය | අමාත්‍යාංශය | අනුමත කරන ලද ගණන |
|---|---|---|
| 1 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන | 15 |
| 2 | මුදල් හා ක්‍රම සම්පාදන | 2 |
| 3 | වරාය හා මහාමාර්ග | 8 |
| 4 | බුද්ධශාසන හා ආගමික කටයුතු | 10 |
| 5 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ | 4 |
| 6 | සෞඛ්‍ය | 7 |
| 7 | ඛනිජ තෙල් කර්මාන්ත | 1 |
| 8 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන | 3 |
| 9 | ජල සම්පාදන හා ජලාපවහන | 1 |
| 10 | සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන | 1 |
| 11 | පළාත් පාලන හා පළාත් සභා | 8 |
| 12 | කර්මාන්ත හා වාණිජ කටයුතු | 9 |
| 13 | විදුලි බල හා බලශක්ති | 1 |
| 14 | ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් | 6 |
| 15 | අධිකරණ | 3 |
| 16 | ආර්ථික සංවර්ධන | 11 |
| 17 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා | 5 |
| 18 | උසස් අධ්‍යාපන | 1 |
| 19 | විදේශ කටයුතු | 1 |
| 20 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු | 12 |
| 21 | පාර්ලිමේන්තු කටයුතු | 2 |
| 22 | තැපැල් සේවා | 7 |
| 23 | ජාතික උරුමයන් පිළිබඳ | 16 |
| 24 | පරිසර | 7 |
| 25 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු | 5 |
| 26 | කම්කරු හා කම්කරු සබඳතා | 1 |
| 27 | අධ්‍යාපන | 2 |
| 28 | වැවිලි කර්මාන්ත | 4 |
| 29 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන | 11 |
| 30 | ඉඩම් හා ඉඩම් සංවර්ධන | 4 |
| 31 | සමාජ සේවා | 11 |
| 32 | ක්‍රීඩා | 3 |
| 33 | කෘෂිකර්ම | 4 |
| 34 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති | 4 |
| 35 | ප්‍රවාහන | 3 |
| 36 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන | 6 |
| 37 | සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ | 16 |
| 38 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ | 6 |
| 39 | දේශීය වෛද්‍ය | 0 |
| 40 | සුළු අපනයන භෝග ප්‍රවර්ධන | 1 |
| 41 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන | 3 |
| 42 | සිවිල් ගුවන් සේවා | 1 |
| 43 | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන | 2 |
| 44 | සංස්කෘතික හා කලා කටයුතු | 2 |
| 45 | ආපදා කළමනාකරණ | 5 |
| 46 | වනජීවී සම්පත් සංවර්ධන | 11 |
| 47 | නැවත පදිංචි කිරීමේ | 2 |
| 48 | මහජන සම්බන්ධතා හා මහජන කටයුතු | 1 |
| 49 | පුද්ගලික ප්‍රවාහන සේවා | 2 |
| 50 | රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන | 4 |
| 51 | විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ | 0 |
| 52 | තාක්ෂණ හා පර්යේෂණ | 7 |
| 53 | ඵලදායිතා ප්‍රවර්ධන | 2 |
| 54 | රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ | 2 |
| 55 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 1 |
| 56 | ජනාධිපති කාර්යාලය | 4 |
| 57 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 0 |
| | එකතුව | 271 |

වගුව අංක 02

- 2012.12.31දින වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති සේවා ව්‍යවස්ථා
    1. ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව
    2. කාර්යාල සේවක සේවයේ සේවා ව්‍යවස්ථාව
    3. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව
    4. ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාව
    5. ශ්‍රී ලංකා මැනුම් ක්ෂේත්‍ර සහායක සේවා ව්‍යවස්ථාව
    6. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවයේ සේවා ව්‍යවස්ථාව
    7. දේශීය ආදායම් සේවා ව්‍යවස්ථාව

- බඳවාගැනීමේ පරිපාටි සංශෝධන

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | සංශෝධන සඳහා ලැබී ඇති බ.ගැ.ප. |
|---|---|
| ශ්‍රී ලංකා රේගුව | රේගු නිලධාරි (SL-01) |
| වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය | 1 . විධායක නිලධර ගණය (SL-01)<br>2. අධ්‍යක්ෂ (ඉංජිනේරු/නාවික) (SL-01) |
| රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | ප්‍රමාණ සමීක්ෂක (MT-02) |
| තැපැල් සේවා අමාත්‍යාංශය | 1 . තැපැල් සේවා නිලධාරි (MN-03)<br>2 . උප තැපැල් ස්ථානාධිපති (MN-01) |
| වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 1.ගොඩනැගිලි නඩත්තු නිලධාරි (MN-03)<br>2.නීති නිලධාරි (SL-01)<br>3.ලොරි සහායක (PL-01) |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ/නීති නිලධාරි (SL-01) |
| පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | ප්‍රජා විශෝධන නිලධාරි (MN -07) |
| ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය (PL-02) |
| කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | විධායක නිලධර ගණය (SL-01) |
| රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | විධායක නිලධර ගණය (SL-01) |

වගුව අංක 03

- සේවා ව්‍යවස්ථා සංශෝධන
    1. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව
    2. ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා ව්‍යවස්ථාව
    3. ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාව

- චක්‍රලේඛ
    1. (2012/01) ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ නිලධාරීන් සඳහා සකස් කරන ලද වැඩ සටහන් නිලධාරි සේවා ව්‍යවස්ථාව
    2. (2012/02) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති 1 වන කාණ්ඩයේ 178 වැනි වගන්තිය සංශෝධනය කිරීම
    3. (2012/03) රාජ්‍ය සේවා කොමිෂන් සභාව අක්‍රියව පැවති කාලය තුළ අමාත්‍ය මණ්ඩලය විසින් දෙනු ලැබූ විනය නියෝගවලට එරෙහිව ඉදිරිපත් කරන ලද අභියාචනා





- 2012.12.31 දිනට නිමකර ඇති ස්ථානමාරු පරිපාටි පිළිබඳ විස්තර
    1. දේශීය ආදායම් සේවය
    2. ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය
    3. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය
    4. සහකාර සුරාබදු කොමසාරිස් සහ සුරාබදු අධිකාරි
    5. වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්
    6. ගොවිජන සංවර්ධන නිලධාරීන්
    7. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය
    8. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන්ගේ සහ සහකාර අධ්‍යක්ෂවරුන්ගේ ස්ථානමාරු පරිපාටිය
    9. සහකාර කම්කරු කොමසාරිස්වරුන්ගේ අභ්‍යන්තර ස්ථානමාරු පරිපාටිය
    10. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන්

- ප්‍රතිපත්ති සම්බන්ධ කටයුතු

| අනු අංකය | අදාළ වන කරුණ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව |
|---|---|---|
| 1 | රාජ්‍ය නැටුම්/සංගීත කණ්ඩායමේ වසර 11ක සේවා කාලයක් සපුරා ඇති (කොන්ත්‍රාත්) ශිල්පීන් සඳහා සුදුසු සේවා තත්ත්වයන් ලබාදීම | සංස්කෘතික හා කලා කටයුතු |
| 2 | ස්ථිර පදනමින් බඳවාගැනීම (කාර්යාල සේවක සේවය/රියදුරු සේවය) | අධිකරණ |
| 3 | රා.ප.ච. 5/2010 අනුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කරන ලෙස ඉල්ලීම (කේ.දහනායක මිය) | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති |
| 4 | හෙද අධ්‍යාපන අධ්‍යක්ෂිකාව විසින් සිසු හෙද නිලධාරි විභාගයෙන් 40% ක් අසමත් කිරීම පිළිබඳව විභාග ගැටළු | සෞඛ්‍ය |
| 5 | තනතුරෙන් මුදාහැර ඒකාබද්ධ සේවයට අන්තර්ග්‍රහණය වීමට කරන ලද ඉල්ලීම | යුද හමුදා සිවිල් පාලන දෙපා. |
| 6 | අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහනය කර ඇති නිලධාරිණියකට ස්ථානමාරු ලබාදීම.(කාන්ති කොට්ටහච්චි මිය) | කම්කරු දෙපා. |
| 7 | කාර්මික හා පරිපාලන නිලධාරි තනතුරේ වැටුප් සම්බන්ධයෙන් අභියාචනය | මිනින්දෝරු දෙපා. |
| 8 | තාවකාලික සේවා කාලය ස්ථිර සේවා කාලයට එකතුකර ගැනීම | සෞඛ්‍ය |
| 9 | පෙර සේවයට පැමිණීම (කම්කරු විනිශ්චය සභා භාෂණ පරිවර්තක සේවයට පැමිණීම) | අධිකරණ |
| 10 | රාජ්‍ය සේවයෙන් අර්ධ රාජ්‍ය සේවයට මුදා හැරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම. | වෙරළ සංරක්ෂණ දෙපා. |
| 11 | රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණියට රා.ප.ච. 06/2006 අනුව MN-05 වැටුප් පරිමාණය අනුමත කිරීම | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපා. |
| 12 | කාර්යාල සේවක සේවයේ 1 පන්තියට උසස් කිරීම | ජාතික කෞතුකාගාර දෙපා. |
| 13 | ගුරු සේවයේ ගැටළු සහගත අවස්ථා කිහිපයක් සඳහා පත්වීම් ස්ථිර කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම. | අධ්‍යාපන |
| 14 | ඉංග්‍රීසි ඩිප්ලෝමා ගුරු සේවයට, පෙර සේවය වූ ස්ථිර මැණුම් ක්ෂේත්‍ර සහායක සේවා කාලය එකතුකර ගැනීම.(කේ.කේ.ඩී. සමීර ප්‍රසන්න මයා) | මිනින්දෝරු දෙපා. |
| 15 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය සම්බන්ධ ගැටළු | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු |
| 16 | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා නිලධාරීන් ස්ථිර කිරීම | ආර්ථික සංවර්ධන |
| 17 | විධායක නිලධාරි ගණයේ 1 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලෙසට ඉල්ලීම | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන |
| 18 | දුම්රිය දෙපාර්තමේන්තුවේ මූලික තාක්ෂණ සේවයේ IIඅා ලෙස ආධුනිකයින් බඳවා ගැනීම | දුම්රිය දෙපා. |
| 19 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු තනතුර සඳහා බඳවාගැනීම | මුදල් හා ක්‍රම සම්පාදන |
| 20 | පෙර සේවා කාලය වර්තමාන සේවා කාලයට එකතුකර ගැනීම | බන්ධනාගාර දෙපා. |
| 21 | ක්ෂේත්‍රගත/කාර්යාලගත - බණ්ඩ 2 නිලධර ගණය සඳහා බඳවාගැනීමේ විවෘත තරඟ විභාගය - 2012 | යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන |

වගුව අංක 04

මෙහි සඳහන් ප්‍රතිපත්තිමය කරුණුවලට අමතරව රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල බෙදීම, විශේෂ අවස්ථාවලදී බඳවාගැනීමේ පරිපාටි සහ සේවා ව්‍යවස්ථාවලින් බැහැරවීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට අදාළ කරුණු සහ වෙනත් පොදු කරුණු සම්බන්ධයෙන් ද ආයතන අංශය කටයුතු කර ඇත.

## 5.2 පත්කිරීම් හා උසස් කිරීම් අංශය

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි අංක 1733/52 හා 2011.11.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පවරා නොමැති, රාජ්‍ය නිලධාරින් (අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ සේවයේ නිලධාරින් හැර) සම්බන්ධයෙන් වන පත්කිරීම් හා උසස් කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පත්කිරීම් හා උසස් කිරීම් අංශය මගින් ඉටුකරනු ලැබේ. මෙම අංශය පහත සඳහන් නිලධාරි මණ්ඩලයෙන් සමන්විත වේ.

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | - | 02 |
| සහකාර ලේකම් | - | 08 |
| පරිපාලන නිලධාරි | - | 01 |
| කළමනාකරණ සහකාර | - | 22 |

### 5.2.1 පත්කිරීම් හා උසස් කිරීම් අංශයෙහි කාර්යභාරය

පත්කිරීම් හා උසස්කිරීම් අංශයේ කාර්යභාරය පහත සඳහන් පරිදි ප්‍රධාන අංශ දෙකක් යටතේ සිදු කෙරේ.

I. **පත්කිරීම්**

අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම්/ උසස්කිරීම් පටිපාටි අනුව බඳවා ගැනීම, සේවයේ ස්ථිර කිරීම, සේවය අවසන් කිරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම, වැඩබැලීමේ/ රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත්කිරීම, මුදාහැරීම (ස්ථිර/ තාවකාලික), කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම, සේවයෙන් ඉල්ලා අස්වීම, සේවයට/ තනතුරට නැවත පත්කිරීම, විශ්‍රාම ගැන්වීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 අනුව, වෛකල්පිත/ අනිවාර්ය/ වෛද්‍ය හේතුන් පදනම මත), විශ්‍රාම ගිය රාජ්‍ය නිලධාරින් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම, සේවා ව්‍යවස්ථාවන්හි උප ලේඛනගත තනතුරුවලට (අදාළ අවස්ථාවන්හිදී) පත්කිරීම.

II. **උසස් කිරීම්**

අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම් පරිපාටි අනුව උසස් කිරීම ( ශ්‍රේණියෙන් ශ්‍රේණියට / ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත) , තනතුරු වලට පත් කිරීම. (ජ්‍යෙෂ්ඨතාවය මත / ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල වලට අනුව)

ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග/ තීරණවලට එරෙහිව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත්






කරනු ලබන අභියාචනා හා ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනුකරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

### 5.2.2 පත්කිරීම් හා උසස්කිරීම් අංශයේ ප්‍රගති සමාලෝචනය - 2012 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා.

| | කාරණය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | අන්තර්ග්‍රහණ | 185 |
| 2 | වැඩ බැලීමට පත්කිරීම | 563 |
| 3 | තනතුරුවලට පත්කිරීම් | 258 |
| 4 | ස්ථිර කිරීම් | 2374 |
| 5 | නැවත සේවයේ යෙදවීම් හා කොන්ත්‍රාත් පත්වීම් | 302 |
| 6 | කාර්යක්ෂමතා කඩඉම් සඳහා සහන කාලයක් ලබා දීම/නිදහස් කිරීම | 699 |
| 7 | ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම් | 2141 |
| 8 | තෝරාගැනීම් මත උසස් කිරීම් | 938 |
| 9 | මුදා හැරීම් | 281 |
| 10 | ඉල්ලා අස්වීම් | 71 |
| 11 | සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම් | 812 |
| 12 | බදවා ගැනීම් (සීමිත) | 186 |
| 13 | බදවා ගැනීම් (විවෘත) | 933 |
| 14 | බදවා ගැනීම් (ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය) | 108 |
| 15 | අංශය වෙත ලද අභියාචනා | 253 |
| 16 | එකතුව | **10104** |

වගුව අංක 05




රූප සටහන අංක 02

අන්තර්ග්‍රහණ

| | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ තනතුර / සේවය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 10 |
| 2 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 127 |
| 3 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 39 |
| 4 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 5 |
| 5 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 4 |
| | එකතුව | 185 |

වැඩ බැලීමට පත් කිරීම්

| | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ තනතුර / සේවය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අතිරේක ලේකම් | 16 |
| 2 | අධ්‍යාපන අමාත්‍යාංශය | 4 |
| 3 | අධිකරණ අමාත්‍යාංශය | 1 |
| 4 | ඉදිකිරීම් ,ඉංජිනේරු සේවා නි. සහ පොදු ප. අමා. | 4 |
| 5 | කම්කරු හා කම්කරු සබඳතා අමා. | 17 |
| 6 | කර්මාන්ත සහ වානිජ කටයුතු අමාත්‍යාංශය | 2 |
| 7 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 20 |
| 8 | ග්‍රාම නිලධාරි | 31 |
| 9 | ජනාධිපති කාර්යාලය | 5 |
| 10 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 2 |
| 11 | තැපැල් සේවා අමාත්‍යාංශය | 35 |
| 12 | තොරතුරු තාක්ෂණ සේවය | 1 |
| 13 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | 4 |
| 14 | නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | 4 |
| 15 | පරිසර අමාත්‍යාංශය | 1 |
| 16 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 53 |
| 17 | යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය | 1 |
| 18 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 26 |
| 19 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 122 |
| 20 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 3 |
| 21 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 2 |
| 22 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 1 |
| 23 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 16 |
| 24 | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය | 94 |
| 25 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 71 |
| 26 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | 23 |
| 27 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 1 |
| 28 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 3 |
| | එකතුව | 563 |





තනතුරුවලට පත්කිරීම්

| | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ තනතුර / සේවය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අතිරේක ලේකම් | 55 |
| 2 | අධ්‍යාපන අමාත්‍යාංශය (ජාතික පාසැල් විදුහල්පතිවරු) | 30 |
| 3 | අධිකරණ අමාත්‍යාංශය | 3 |
| 4 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 1 |
| 5 | ක්‍රීඩා අමාත්‍යාංශය | 1 |
| 6 | කාලගුණ විද්‍යා දෙපා. | 4 |
| 7 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 1 |
| 8 | ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ | 7 |
| 9 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 15 |
| 10 | නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | 5 |
| 11 | ප්‍රවාහන අමාත්‍යාංශය | 2 |
| 12 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 7 |
| 13 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 3 |
| 14 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 4 |
| 15 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 116 |
| 16 | සර්වේ ජනරාල් | 2 |
| 17 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 2 |
| | එකතුව | 258 |

## ස්ථිර කිරීම්

| | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / සේවය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යාපන අමාත්‍යාංශය | 14 |
| 2 | අධිකරණ අමාත්‍යාංශය | 1 |
| 3 | ඉදිකිරීම් ,ඉංජිනේරු සේවා නිවාස සහ පොදු පහසුකම් අමා. | 11 |
| 4 | කම්කරු හා කම්කරු සබඳතා අමා. | 7 |
| 5 | කර්මාන්ත සහ වානිජ කටයුතු අමාත්‍යාංශය | 16 |
| 6 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 1 |
| 7 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 2 |
| 8 | ජනාධිපති කාර්යාලය | 13 |
| 9 | තක්සේරු දෙපාර්තමේන්තුව | 22 |
| 10 | තැපැල් සේවා අමාත්‍යාංශය | 1 |
| 11 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 72 |
| 12 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | 15 |
| 13 | පද්ධති විශ්ලේෂක | 1 |
| 14 | පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 22 |
| 15 | පුනරුත්තාපන සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 6 |
| 16 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 9 |
| 17 | යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය | 11 |
| 18 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 111 |
| 19 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 1 |
| 20 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 2 |
| 21 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 6 |
| 22 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 119 |
| 23 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 76 |
| 24 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 49 |
| 25 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 207 |
| 26 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 7 |
| 27 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 134 |
| 28 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 160 |
| 29 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | 2 |
| 30 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 1266 |
| 31 | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 10 |
| | එකතුව | 2374 |





## නැවත සේවයේ යෙදවීම් හා කොන්ත්‍රාත් පත්වීම්

| | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව / තනතුරු / සේවය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 2 |
| 2 | අතිරේක ලේකම් | 2 |
| 3 | අධිකරණ අමාත්‍යාංශය | 29 |
| 4 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 1 |
| 5 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 16 |
| 6 | ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශය | 3 |
| 7 | ඒකාබද්ධ තැපැල් සේවය. | 8 |
| 8 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 6 |
| 9 | කර්මාන්ත හා වානිජ අමාත්‍යාංශය | 1 |
| 10 | ග්‍රාම නිලධාරී | 28 |
| 11 | ජනමාධ්‍ය හා තොරතුරු | 3 |
| 12 | ජ්‍යෙෂ්ඨ අමාත්‍ය කාර්යාලය | 2 |
| 13 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 1 |
| 14 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 27 |
| 15 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 4 |
| 16 | ප්‍රවාහන අමාත්‍යාංශය | 89 |
| 17 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රවර්ධන අමාත්‍යාංශය | 2 |
| 18 | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය | 1 |
| 19 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 2 |
| 20 | භාෂා පරිවර්තක සේවය | 1 |
| 21 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 3 |
| 22 | යෞවන කටයුතු හා නිපුනතා අමාත්‍යාංශය | 1 |
| 23 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 2 |
| 24 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 19 |
| 25 | වරාය හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | 1 |
| 26 | වාරිමාර්ග අමාත්‍යාංශය | 1 |
| 27 | වාස්තු විද්‍යාඥ සේවය | 2 |
| 28 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 5 |
| 29 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 2 |
| 30 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 1 |
| 31 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 1 |
| 32 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 4 |
| 33 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 32 |
| | එකතුව | 302 |

## කාර්යක්ෂමතා කඩඉම් සඳහා සහන කාලයක් ලබා දීම/ නිදහස් කිරීම

| | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / සේවය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යාපන අමාත්‍යාංශය | 19 |
| 2 | අධිකරණ අමාත්‍යාංශය | 66 |
| 3 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 1 |
| 4 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 7 |
| 5 | ඉදිකිරීම් ,ඉංජිනේරු සේවා නි. සහ පොදු ප. අමා. | 2 |
| 6 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 2 |
| 7 | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 197 |
| 8 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | 8 |
| 9 | තැපැල් සේවා අමාත්‍යාංශය | 2 |
| 10 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 1 |
| 11 | ප්‍රවාහන අමාත්‍යාංශය | 20 |
| 12 | පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 10 |
| 13 | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය | 1 |
| 14 | පුනරුත්ථාපන සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමා. | 10 |
| 15 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 36 |
| 16 | යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය | 4 |
| 17 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 7 |
| 18 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 56 |
| 19 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 67 |
| 20 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 1 |
| 21 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 6 |
| 22 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 4 |
| 23 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 1 |
| 24 | සමාජ සේවා අමාත්‍යාංශය | 43 |
| 25 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 80 |
| 26 | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 1 |
| 27 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 2 |
| 28 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 10 |
| 29 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 6 |
| 30 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 1 |
| 31 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 19 |
| 32 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 8 |
| 33 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 1 |
| | එකතුව | 699 |





## ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම්

| | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / තනතුර / සේවය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කර්මාන්ත සහ වානිජ කටයුතු අමාත්‍යාංශය | 9 |
| 2 | කාර්මික සහකාර සේවය | 2 |
| 3 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 20 |
| 4 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 11 |
| 5 | තැපැල් සේවා අමාත්‍යාංශය | 3 |
| 6 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | 1 |
| 7 | ප්‍රවාහන අමාත්‍යාංශය | 2 |
| 8 | පොලිස් අධිකාරී II | 27 |
| 9 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 33 |
| 10 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 1 |
| 11 | වාරිමාර්ග අමාත්‍යාංශය | 1 |
| 12 | විදේශ සේවය | 1 |
| 13 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 15 |
| 14 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 23 |
| 15 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | 92 |
| 16 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 20 |
| 17 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 97 |
| 18 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය | 90 |
| 19 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 253 |
| 20 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 15 |
| 21 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 17 |
| 22 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | 1 |
| 23 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | 22 |
| 24 | ශ්‍රී ලංකා විගණන සේවය | 9 |
| 25 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 1307 |
| 26 | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | 40 |
| 27 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 29 |
| | එකතුව | 2141 |

**තෝරා ගැනීම් මත උසස් කිරීම්**

| | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / තනතුර /සේවය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය) | 101 |
| 2 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය 1 (අධිසේවක පදනම මත) | 4 |
| 3 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය ( 1 පංතිය) | 14 |
| 4 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (විශේෂ ශ්‍රේණිය) | 72 |
| 5 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 2 |
| 6 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | |
| | ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය | 59 |
| | ශ්‍රී ලංකා රේගුව | 29 |
| | සුරා බදු දෙපාර්තමේන්තුව | 10 |
| | තක්සේරු දෙපාර්තමේන්තුව | 8 |
| 7 | සෞඛ්‍ය අමාත්‍යාංශය | |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 2 |
| | විශේෂඥ වෛද්‍යවරු | 132 |
| | පරිපූරක වෛද්‍ය | 121 |
| | අතුරු වෛද්‍ය | 20 |
| 8 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | |
| | පුස්තකාලයාධිපති | 21 |
| | රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 4 |
| | රාජ්‍ය කලමනාකරණ සේවය අධි පන්තිය | 269 |
| 9 | සංස්කෘතික අමාත්‍යාංශය | |
| | සිංහල විශ්ව කෝෂ කර්තෘ | 1 |
| 10 | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | |
| | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | 5 |
| 11 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | |
| | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 3 |
| 12 | තැපැල් සේවා අමාත්‍යාංශය | |
| | ඒකාබද්ධ තැපැල් සේවය | 28 |
| 13 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | |
| | පොලිස් දෙපාර්තමේන්තුව | 23 |
| 14 | නීතිපති දෙපාර්තමේන්තුව | 5 |
| 15 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | 5 |
| | **එකතුව** | 938 |





**මුදා හැරීම්**

| | අමාත්‍යාංශය / සේවය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යාපන අමාත්‍යාංශය | 30 |
| 2 | අධිකරණ අමාත්‍යාංශය | 1 |
| 3 | ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 2 |
| 4 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 1 |
| 5 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 5 |
| 6 | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 2 |
| 7 | ප්‍රවාහන අමාත්‍යාංශය | 1 |
| 8 | පරිසර අමාත්‍යාංශය | 1 |
| 9 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 17 |
| 10 | යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය | 1 |
| 11 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 2 |
| 12 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 156 |
| 13 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 32 |
| 14 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 7 |
| 15 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 1 |
| 16 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 1 |
| 17 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 19 |
| 18 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 2 |
| | **එකතුව** | 281 |

**ඉල්ලා අස්වීම්**

| | අමාත්‍යාංශය / දෙපාර්තමේතුව / සේවය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යාපන අමාත්‍යාංශය | 1 |
| 2 | ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 3 |
| 3 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 1 |
| 4 | පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 2 |
| 5 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 1 |
| 6 | යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය | 1 |
| 7 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 3 |
| 8 | ජනාධිපති කාර්යාලය | 3 |
| 9 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 1 |
| 10 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 23 |
| 11 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 11 |
| 12 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 1 |
| 13 | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | 1 |
| 14 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 4 |
| 15 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | 15 |
| | **එකතුව** | 71 |